## පාරම්පරික දැනුම යනු කුමක්ද?

පාරම්පරික දැනුම යනුවෙන් සරල ව අදහස් කරන්නේ ශ්‍රී ලාංකේය අනන්‍යතාවක් සහිත අන්කිසිවෙකුගේ අභාසයකින් හෝ අනුකරණයකින් තොර ව අපට ම අවේණික වූත්, අනන්‍යවූත් අපගේ පැරන්නන් විසින් අතීතයේ සිට මේ දක්වා පරම්පරානුගත ව වාචික ව හා ලිඛිත ව සුරක්ෂිත ව රැගෙන ආ කෘෂිකාර්මික, කාර්මික, වෛද්‍ය, සංස්කෘතික, අධ්‍යාපනික යනාදී සියලු අංශයන් ආවරණය වන පරිදි සැකසී ඇති ඉපැරණි දැනුම යි.



## පාරම්පරික දැනුම වැදගත්වන්නේ ඇයි?

පාරම්පරික ව එන දේශීය දැනුම අභාවයට යාම නිසා අපගේ ශ්‍රී ලාංකේය අනන්‍යතාව ක්‍රමයෙන් මියැදෙමින් පවතින අතර එය සුරක්ෂිත කොට, අනාගත පරපුරට දැකබලා ගැනීමටත්, ඒවා යළි ක්‍රියාත්මක කර එහි ඇති වැදගත්කම පිළිබඳ ව වඩාත් පර්යේෂණාත්මක ඇසකින් බලා නවීන ලෝකය හමුවේ තැබීමට කටයුතු කිරීමත් අද දවසේ මේ කෙරෙහි උනන්දුවක් දක්වන අයගේ වගකීම වේ. දේශීය දැනුම ලේඛනගත නොවීම හේතුවෙන් ශ්‍රී ලංකාවට ආවේණික වූ විවිධ අංශයන් පිළිබඳ දැනුමෙහි බුද්ධිමය අයිතිය විදේශයන් කරා හිමිවීම ඛේදනීය තත්වයක් වන අතර අපගේ දේශීය දැනුම ලේඛනගත කිරීමේ අවශ්‍යතාව අන්කවරදාකටත් වඩා වර්තමානයේ දී වැදගත් වන්නේ එබැවිනි.

## පාරම්පරික දැනුම ඇතුළත් ප්‍රධාන අංශ

පරම්පරානුගත ව පැවත එන දේශීය දැනුම පිළිබිඹු කෙරෙන අංශ අතර කෘෂිකර්මය, වාරි තාක්ෂණය, ජල කළමණාකරණය, යකඩ තාක්ෂණය, ආදි මානවයන් සතු දැනුම, ආහාර තාක්ෂණය, දේශීය වෛද්‍ය ක්‍රමය, ගෘහ කර්මාන්ත, වනාන්තර භාවිතය, වාස්තු විද්‍යාව, ධීවර කර්මාන්තය සහ කලා ශිල්ප පිළිබඳ පාරම්පරික දැනුම ඉතා වැදගත් ලෙස හඳුනාගත් අංශයෝ වෙති. වනාන්තර, ධීවර, කෘෂිකර්මය, දේශීය වෙදකම යන ක්ෂේත්‍රවල ජෛව විවිධත්වයට අදාළ පාරම්පරික දැනුම ඍජු ව භාවිත වන අතර යකඩ තාක්‍ෂණය, ගුප්ත විද්‍යා ආදී ක්ෂේත්‍රවල ද එය වක්‍රලෙස භාවිත වේ.

## පාරම්පරික දැනුම සංරක්ෂණය විය යුත්තේ ඇයි?

අනාදිමත් කාලයක් තිස්සේ පැවති අපගේ දේශීය දැනුම පිළිබඳ පාරම්පරික අත්දැකීම් ශීඝ්‍රයෙන් විනාශ වෙමින් පවතී. බොහෝ දැනුම් අංශයන් පිළිබඳ තොරතුරු සොයා ගැනීම පවා වර්තමානයේ අසීරු වී තිබේ. මෙම තත්ත්වය හඳුනාගත් අන්තර්ජාතික ප්‍රජාව 1992 දී ඇති කරගත් ජෛව විවිධත්වය පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ 8(J) වගන්තිය අනුව දේශීය ජනතාව හා පාරම්පරික දැනුම ආරක්ෂා කර පෝෂණය කිරීම සෑම රටක ම වගකීමක් ලෙස හඳුනා ගෙන තිබේ. මේ නිසා දැනට ශේෂ ව පවතින දේශීය දැනුම ජාතියේ ඉදිරි පරපුර වෙනුවෙන් සංරක්‍ෂණය කර තබා ගැනීම ශ්‍රී ලාංකේය ජාතිය සතු යුතුකමක් වන්නේ ය.



# පාරම්පරික දැනුම පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය 2009

**2009 නොවැම්බර් මස 23-25**

**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය**

**බෙලිහුල්ඔය**

*සංවිධානය:*

**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය**

**ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය**
**පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යංශය**

**ආණ්ඩුකාර කාර්යාලය**
**සබරගමුව පළාත් සභාව**

# අපේ උරුමය

වසර තිස්දහසකට අධික ඉපැරණි ඉතිහාසයක් සහිත ශ්‍රී ලාංකේය ජන සමාජය මේ දක්වා සිය ජීවිත පවත්වා ගෙන යාමේ දී එදිනෙදා ජීවනෝපායට අමතර ව සිය අනන්‍යතාව සුරැකෙන පරිදි ස්වකීය පරිසරය, ගෘහනිර්මාණය, වාස්තු විද්‍යාව, සටන් ශිල්ප ක්‍රම, කෘෂිකර්මය, වෙදකම, ආහාර තාක්ෂණය, සත්ව පාලනය, කලා ශිල්ප යනාදී සෑම අංශයක් ම පාදක කරගනිමින් ශ්‍රී ලාංකේය අනන්‍යතාවක් සහිත ජන සමාජයක් හා සංස්කෘතියක් ඇති බව ලෝකය හමුවේ තැබීමට සමත් වී ඇත. ඉපැරණි ශ්‍රී ලාංකේය ජන සමාජය "වැවයි දාගැබයි ගමයි පන්සලයි" යන සංකල්පය මත පදනම්ව පැවැති බවට ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාක්ෂි බොහෝය. ප්‍රධාන වශයෙන් අනුරාධපුර, පොළොන්නරුව, දඹදෙණි රාජධානින්හි මෙම සංකල්පය ඉතා ප්‍රචලිත ව පැවැති අතර ශ්‍රී ලාංකාවේ රුහුණු, පිහිටි හා මායා යන ත්‍රිවිධ ප්‍රදේශයන් ම ආවරණය වන පරිද්දෙන් එය ක්‍රියාත්මකව පැවැති බව ඉපැරණි නෂ්ටාවශේෂ සාක්ෂි දරයි.





අපගේ උරුමයෙහි ඇති විශේෂත්වය වන්නේ එය මිනිස් ජීවිතයේ සියලු අංශයන් ආවරණය වන පරිද්දෙන් සැකසී තිබීම යි. මිනිසාගේ උත්පත්තියේ සිට මරණය දක්වා මුළු කාල පරාසයට අදාළ වන පරිදි විවිධ ක්ෂේත්‍ර යටතේ දියුණු වී පැවැති දේශීය දැනුම, කෘෂිකර්මය, යකඩ තාක්‍ෂණය, ගුප්ත විද්‍යාව, දේශීය සටන් ශිල්පය, ආහාර තාක්ෂණය, දේශීය වෛද්‍ය ක්‍රමය, ගෘහ නිර්මාණ ශිල්පය, ධීවර කර්මාන්තය, වනාන්තර භාවිතය, කලා ශිල්ප යනාදී මෙකී නොකී සෑම අංශයකට ම අදාළ වන පරිද්දෙන් පෝෂණය වී තිබේ. මෙසේ පැවැති දියුණු තාක්ෂණික ක්‍රම, අත්දැකීම් හා පුහුණුව පරම්පරාවෙන් පරම්පරාවට ක්‍රමයෙන් හීනවෙමින් ද, ආ බොහෝ ලිඛිත මූලාශ්‍රයන්ගේ දුලබතාව නිසා ද ක්‍රමයෙන් අභාවයට පත්වන තත්වයක් ශ්‍රී ලාංකික සමාජය තුළ දක්නට තිබේ. එහෙත් දිවයිනේ බොහෝ ඈත ගම්දනව්වල ඉතා අල්පයක් ලෙස ශේෂව පවතින අපගේ ඉපැරණි දේශීය දැනුම වර්තමානයේ භාවිත වන නවීන ක්‍රම පරයා යන බවක් ද අනෙක් අතට නවීන සොයාගැනීම් බොහොමයක මූලාරම්භය දේශීය දැනුම බව ද නොකිවමනා ය.



අහස උසට නැගුනු දාගැබ් හා විහාරද, සීගිරිය වැනි ලොව පුදුම කරවන නිර්මාණයන්ද, රජරටට වාරිජලය සැපයූ විශ්මිත යෝධ ඇළද, අපගේ දේශිය තාක්‍ෂණික දැනුම පිළිබඳ සාඩම්බර විය හැකි අදටත් අප අතර විද්‍යමාන වන දැවැන්ත නිර්මාණ අතුරින් කිහිපයකි. මීට අමතර ව සඳකඩපහණ, කුට්ටම්පොකුණ, රුවන්වැලි මහා සෑය, අපගේ අභිමානවත් වාස්තු විද්‍යාත්මක තාක්ෂණය ලොව හමුවේ තබයි. සීගිරි බිතුසිතුවම්, ඇම්බැක්කේ ලී කැටයම් අපගේ ඉපැරණි කලාකරුවාගේ විශ්මිත නිර්මාණයෝ ය. එමෙන්ම සමාධි බුදුපිළිමය, පොළොන්නරුව ගල් විහාරය ආශ්‍රිත නිර්මාණ අපගේ සංස්කෘතිය සහ ආධ්‍යාත්මික හරයන් පිළිබඳ ඓතිහාසික සාක්ෂීන් වේ.

අපේ හෙළ වෙදකම පිළිබඳ කියාපාන මිහින්තලේ, මැදිරිගිරිය, පොළොන්නරුව ප්‍රදේශයන්හි පිහිටා ඇති ඉපැරණි රජ සමයන්ට අයත් ශෛලමය බෙහෙත් ඔරු ආදී නෂ්ටාවශේෂයන් මගින් පිළිබිඹු කරන්නේ අතීත ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශයේ පැවති සෞභාග්‍යය යි. උඩරට, පහතරට, සබරගමු නැටුම් කලාව කෝලම් නාට්‍ය සහ ජන ගී මගින් ශ්‍රී ලාංකේය ජනයාගේ සෞන්දර්ය රසිකත්වයේ අපූර්වත්වය මැනවින් පිළිබිඹු කෙරේ. මීට අමතර ව සමනලවැව ප්‍රදේශයෙන් සොයාගෙන ඇති ඉපැරණි යකඩ සකසා ගැනීමේ දේශීය තාක්ෂණය වර්තමානය වන විට ද ජාත්‍යන්තර තලයේ පර්යේෂණවලට බඳුන් වෙමින් පවතී.

